

පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරය

நிருவாக மேன்முறையீடுகள் நியாய சபை

Administrative Appeals Tribunal

කාර්ය සාධන වාර්තාව

2025

පරීපාලන අභියාචන විනිශ්චය අධිකාරය

2025 කාර්ය සාධන වාර්තාව

	පටුන	පිටු අංකය
1.1	හැඳින්වීම	1
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර අරමුණු	1
1.3	ප්‍රධාන කාර්යයන්	1
1.4	සංවිධාන සටහන්	2
02.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	3
03.	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුල්‍ය කාර්ය සාධනය	4
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	6
3.3	මුදල් ප්‍රවහ පිළිබඳ ප්‍රකාශය	7
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	8
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	8
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	8
3.9	විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ආවරණ ලිපිය	10
	විගණකාධිපතිගේ වාර්ෂික විගණන වාර්තාව	11
04.	කාර්යසාධන දර්ශක	15
05.	නිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීම් කාර්ය සාධනය	15
06.	මානව සම්පත් පැතිකඩ	15
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	15
6.3	මානව සම්පත් සංවර්ධන	15
07.	අනුකූලතා වාර්තාව	16

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

වැය ශීර්ෂ අංක 09

1.1 <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 (1) ඡේදය ප්‍රකාරව 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානයන් මඟින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පිහිටුවා ඇත.

1.2 <u>ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු</u>

1.2.1. <u>දැක්ම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව සහ විගණන සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන පත්කිරීම්, උසස් කිරීම් හා විනය කටයුතු සම්බන්ධයෙන් ගනු ලබන තීන්දු හා තීරණයන්ට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, විධිමත්ව සලකා බැලීමෙන් පසු, එකී තීන්දු හා තීරණයන් හි දෝෂයන් ඇත්නම් ඒවා නිසි අයුරින් නිවැරැදි කරමින් ඒ අනුව නියෝග නිකුත් කිරීම.

1.2.2. <u>මෙහෙවර</u>

ඉහත කී කොමිෂන් සභා තුන විසින් ගනු ලැබූ තීරණයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචන භාරගෙන, ඒ අභියාචනා සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගෙන් කරුණු විමසීමෙන් අනතුරුව; ව්‍යවස්ථාපිත අණපනත්, රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසිවල ඇතුළත් විධිවිධාන සහ උපරිමාධිකරණ නඩු තීන්දු යනාදිය ද, සලකා බැලීමෙන් අනතුරුව, ඉහත කී කොමිෂන් සභා මඟින් ලබා දී තිබෙන තීරණයන් හේතුවෙන් කිසියම් නිලධාරියෙකුගේ අයිතිවාසිකම් කඩවී ඇති බවට කරුණු හෙළිදරව් වන්නේ නම්, ඒවා නිවැරැදි කරමින් උචිත නියෝගයන් නිකුත් කිරීම.

1.3 <u>ප්‍රධාන කාර්යයන්</u>

1.3.1 රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයන්ට සහ නියමයන්ට එරෙහිව ගොනු කරනු ලබන අභියාචන විමර්ශනය කර විනිශ්චයන් ලබාදීම

1.3.2. අභියාචන භාර ගැනීම


2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 4 (1) සහ 4(2) අනුව ඉදිරිපත් කළ යුතු ය.

1.3.3 අභියාචනයක් ලද පසු ගන්නා පියවර

එකී පනතේ 5(1) සහ 5(2) ක්‍රියාපරිපාටිය මූලික පියවර ගෙන 6(අ), (ආ), (ඇ), (ඈ) අනුව ක්‍රියා කිරීම

1.3.4 අදාල පනතේ 8(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නඩු විභාගයන් සිදු කරනු ලබන අතර 8(2) වගන්තියට අනුව එකි තීරණ අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය අධිකරණයක යම් නඩුවකදී හෝ නඩු කටයුත්තකදී හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

1.4 <u>සංවිධාන සටහන</u>



1.5 විනිශ්චය අධිකාරය පත් කිරීම

ඉහත කී 2002 අංක 4 දරන පනතේ 2 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සභාපතිතුමා ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කරනු ලැබේ.

2025.12.31 දිනට සංයුතිය:

සභාපති	විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මහතා
සාමාජික	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ජේ.ජේ.රත්නසිරි මහතා
සාමාජික	විශ්‍රාමික මහාධිකරණ විනිසුරු එස්.නන්දසේකරන් මහත්මිය

ලේකම්	ජී.වඩුගේ මහතා
සහකාර ලේකම්	කේ.ජී.ප්‍රියන්ති මංගලික මහත්මිය
ගණකාධිකාරී	ජේ.ජී.එන්.සී.ජයකොඩි මහතා

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

I. අභියාචන සම්බන්ධ ප්‍රගතිය - 2025.12.31 දිනට


2025.01.01 දිනට ඉදිරියට ගෙන ආ අභියාචන සංඛ්‍යාව		1074
2025 වර්ෂය තුළ ලද අභියාචන සංඛයාව	673	673
කාලසීමාව තුළ විභාග කිරීමට තිබූ මුළු අභියාචන සංඛ්‍යාව		1,747
කාලසීමාව තුළ ඉල්ලීමට ඉඩදුන් අභියාචන සංඛ්‍යාව	102	
කාලසීමාව තුළ ඉල්ලා අස්කරගත් අභියාචන සංඛ්‍යාව	100	
නිෂ්ප්‍රභ කළ අභියාචන සංඛ්‍යාව	558	
විවිධ හේතූන් මත බැහැර කරන ලද අභියාචන	77	
ඒ අනුව මෙම කාලසීමාව තුළ අවසන් කළ අභියාචන සංඛ්‍යාව		837
2025.12.31 දිනට අවසන් නොවූ 2026 වර්ෂයට ගෙන ගිය අභියාචන සංඛ්‍යාව		910

II. ඉදිරි දැක්ම

කිසියම් අභියාචනයක් විමසා තීරණය ප්‍රකාශ කිරීමේ දී පාර්ශවකරුවන් සතු නීතියේ මූලධර්ම අනුගමනය කරමින් සහ හැකි ඉක්මණින් තීන්දු ලබාදීම.

පරිපාලන නීති මූලධර්ම අනුගමනය කරමින් සහ රාජ්‍ය චක්‍රලේඛවල සඳහන් නියමයන් පදනම් කරගනිමින් විනිශ්චය අධිකාරයේ කර්තව්‍යයන් නිවැරැදි ආකාරයට පවත්වාගෙන යාමට අවශ්‍ය සහය දෙමින්, පරිපාලන පදනම ශක්තිමත්ව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම

03 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය




ඒසිඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තක්සේරු 2025 රු.	2024 රු.	
	ආදායම් ලැබීම්		-	-	
	පාදායම් බදු	1	-	-	
	ඒදේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	විදේශ ආධාර ආදායම් හා වෙනත්	4	-	-	
-	**මූල ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		42,529,000	35,800,000	ඒසිඒ-3
	තැන්පතු		-	-	ඒසිඒ-4
	අන්තිකාරම් ගිණුම්		760,200	761,900	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මූල ආදායම් නොවන ලැබීම් (ආ)**		**43,289,200**	**36,561,900**	
-	**මූල ආදායම් ලැබෙන සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**43,289,200**	**36,561,900**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		61,423	55,527	
	ශුද්ධ ආදායම් ලැබෙන සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		43,227,777	36,506,373	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
31,100,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	25,173,504	20,710,540	
16,685,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	15,433,563	14,993,332	ඒසිඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
47,785,000	**මූල පුනරාවර්තන වියදම් (ඒ)**		**40,607,067**	**35,703,872**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්පාදනය හා වැඩදියුණු කිරීම්	10	-	-	
1,615,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,557,101	975,945	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
100,000	හැකියා වර්ධනය	14	67,000	13,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
1,715,000	**මූල මූලධන වියදම් (උ)**		**1,624,101**	**988,945**	
	තැන්පතු ගෙවීම්		-	-	ඒසිඒ-4
	අන්තිකාරම් ගෙවීම්		1,956,860	490,000	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,956,860	490,000	
-	**මූල වියදම් එ = (ඒ+උ+ඌ)**		44,188,028	37,182,817	
49,500,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(960,251)**	**(676,444)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(960,251)**	**(676,444)**	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-සී

	සටහන	නත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	23,370,038	21,812,937
මූල්‍ය වත්කම්			
ප්‍රාග්ධනාරම්භ ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	2,305,760	1,109,100
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		25,675,798	22,922,037
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,305,760	1,109,100
දේපළ පිරියත හා උපකරණ සංචිතය		23,370,038	21,812,937
සමුපා හා විධ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
පාරිභෝගික ගිණුම්	ඒසීඒ-4	-	-
අදාළ ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		25,675,798	22,922,037

පිටු අංක 07 සිට 20 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 21 සිට 25 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත සඳහන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවට්ත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණ්දීමේ නිලධාරි
නම්
තනතුර
දිනය 2026.02.19
කේ.ටී. චිත්‍රසිරි
විශේෂික ශ්‍රේෂ්ඨාධිකාරණ
සභාපති
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

ගණ්දීමේ නිලධාරි
නම්
තනතුර:
දිනය: 2026.02.19
පී. විසුදේ
ලේකම්
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

නම්:
දිනය:
පේ.පී.එන්.සී. ජයකොඩි
ගණකාධිකාරි
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	නත්‍ය	සංශෝධිත
	2025	2024
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය විදුම් ආදායම්	-	-
සෙස්තු ආයෝජන ඇසුරුම්වලින් ලැබුණු ලාභ සියුපත්‍ර	-	-
වෙනත්	-	-
සඳහන් කළහොත් ලාභාංශ ආදායම්	-	-
මෙහෙයුම් සඳහා පිරිවැය ඇසුරුවලින් එකතු කරන ලද ආදායම්	896,851	665,244
මූල්‍ය ලාභ	42,529,000	35,800,000
ගෙවීම්කරුවන් සහ වෙනත් ලාභ ලැබීම්	760,200	761,900
වෙනත් ආදායම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	44,186,051	37,227,144
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්		
ගබඩාවල් සහ තොග වෙනස්වීම්	40,543,667	35,692,672
ගෙවිය යුතු ගිණුම්වල වෙනස්වීම්	-	-
මූල්‍යමය විදුම්වල මුහුණතට්ටම්කිරීම, මූලධන මාරුනිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	-	-
ලැබිය යුතු ගිණුම් වෙනස්වීම් දරන ලද වියදම්	-	-
ගෙවිය යුතු ගිණුම්වල සියවින ලද අඩුම	61,423	55,527
ගෙවීම්කරුවන් ණයවීම්	1,956,860	490,000
වෙනත් ණයවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	42,561,950	36,238,199
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	1,624,101	988,945
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
ස්ථිර වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
දේපළ ප්‍රයිකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ආ)	-	-
මූල්‍යකරණ මුදල් වැය කිරීම්		
මූල්‍යමය වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	1,624,101	988,945
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	1,624,101	988,945
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ආ)-(ඉ)	(1,624,101)	(988,945)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
කෙටිකාලීන ණය ගැනීම්	-	-
දීර්ඝකාලීන ණය ගැනීම්	-	-
කොටස්වලින් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
මූල්‍යකරණ මුදල් වැය කිරීම්		
කෙටිකාලීන ණය ආපසු ගෙවීම්	-	-
දීර්ඝකාලීන ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-
මුදල් සහ ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්ඩීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
		සංශෝධිත
	2025	2024
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	896,851	665,244
අග්‍රිම ලැබීම්	42,529,000	35,800,000
අත්තිකාරම් අයකර ගැනීම්	760,200	761,900
තැන්පතු ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	44,186,051	37,227,144
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	40,543,667	35,692,672
සහනාධාර සහ මාරුකිරීම්	-	-
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	61,423	55,527
අත්තිකාරම් ගෙවීම්	1,956,860	490,000
තැන්පතු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	42,561,950	36,238,199
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	1,624,101	988,945
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	1,624,101	988,945
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	1,624,101	988,945
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(1,624,101)	(988,945)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (ඇ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - නැත

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.3.9900	වෙනත් ආදායම්	ඇස්තමේන්තු කළ නොහැක.	-	130,550/-	-

රු. 000

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන ප්‍රාග්ධන	48,600,000 900,000	47,785,000 1,715,000	40,607,067 1,624,101	85% 95%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - **නැත.**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	2,3370,038	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

රු. 000

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක -

කාර්ය සාධන දර්ශක පිළියෙල කර නොතිබුණි.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

අධිකරණමය කටයුතු කෙරෙන බැවින් තිරසාර සංවර්ධන අරමුණු ඇස්තමේන්තු කළ නොහැක.

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. - අදාල නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	03	03	-
තෘතීයික	-	-	-
ද්විතියක	21	13	08
ප්‍රාථමික	08	07	01
එකතුව	32	23	09

6.2 පවතින සීමිත කාර්ය මණ්ඩලයට පුරප්පාඩු ද ආවරණය වන පරිදි ප්‍රායෝගික වශයෙන් යෝග්‍ය වන ආකාරයට රාජකාරී පවරා ඇති බැවින් අධිකාර කාර්යාලයීය රාජකාරී කටයුතු කෙරෙහි බලපෑමක් සිදු නොවීම.

6.3 මානව සම්පත් සංවර්ධන

වැඩසටහනේ නම	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාල සීමාව**	**සමස්ථ ආයෝජනය රු. '000**		**වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)**	**නිමැවුම් / ලබාගත් දැනුම**
			දේශීය	විදේශීය		
ස්ථාවර වත්කම් ලේඛන සැකසීම හා පවත්වාගෙන යාම	01	දින 02			දේශීය	
පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 02			දේශීය	
ප්‍රසම්පාදන කටයුතු පුහුණුව	01	දින 02			දේශීය	
ලිපිගොනුකරණය	02	දින 02			දේශීය	
			67,000./-			

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.2	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුල නොවේ.	ඒ සඳහා ලිපිකරු නිලධාරියෙකු යොදවා ඇත.
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ එන් 20) යාවත්කාලීනකර පවත්වාගෙන	අනුකූල වේ.		

	යාම			
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණකයෙකු නොමැති නිසා එවැනි සැලසුම් සකස් නොකිරීම	ඉදිරි වර්ෂය අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට අදහස් කරමි.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (එන්ඩීබී) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**	අදාල නොවේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර	අනුකූල වේ.		

	ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදුකෙට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ගර්හිත වාහන නොවීම	අවශ්‍ය වුවහොත් එසේ කිරීමට අදහස් කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අක්‍රිය බැංකු ගිණුම් නොවීම	අක්‍රිය බැංකු ගිණුම් ඇති නොවීමට කටයුතු කිරීම
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල්	අනුකූල වේ.		

	රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල නොවේ.	කල් ඉකුත් වූ ණය ශේෂ නොවීම	හිඟ ණය ශේෂ වුවහොත් එසේ කටයුතු කිරීම
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	පොදු තැන්පත් ගිණුමක් නොවීම	පොදු තැන්පත් ගිණුමක් සඳහා අවශ්‍යතාවක් ඇතිවූවහොත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිද කටයුතු කිරීම
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ.	තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම කරනු නොලැබේ.	එවැනි අවශ්‍යතාවක් වුවහොත් එපරිදි කටයුතු කිරීම
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		

15	**ආදායම් ගිණුම**	අනුකූල නොවේ.	ආදායම් ගිණුමක් නැත.	ආදයම් ඉපයීමේ ආයතනයක් නොවේ.
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	පුහුණුවීම් ලබා දී නැත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 5/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්ම කර තිබීම	අනකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ඉදිරි වර්ෂය සඳහා පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීමට කටයුතු යොදා ඇත
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගැයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ.	අධිකරණමය ක්‍රියාදාමයක් සිදුවන ආයතනයක් බැවින් මෙවැන්නක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාව	ඉදිරි වර්ෂය සඳහා පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරගෙන යනු ලබයි.

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රා.පරි.චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහනා මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 22 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	වෙන් කරදී ඇති ප්‍රතිපාදන මත පුහුණුවීම සඳහා නිලධාරින් යෙදවීමට කටයුතු කෙරේ.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	සමස්ත කාර්ය මණ්ඩලය 22 දෙනෙකු වන නිසා අධිකරණමය කාර්යය භාරයයට මුල්තැන දී කටයුතු කිරීම	කාර්ය සාධන ගිවිසුම අත්සන් කර නැත.
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PIC/B/AAT/2/25/02

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2026 මැයි 19 දින

20 MAY 2026

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/AAT/2/25/02

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 මැයි 19 දින

20 MAY 2026

SRI LANKA

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

ශීර්ෂය - 009 පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොමැති වීම හේතුවෙන් වැයවිෂයයන් 15 ක සියයට 9 සිට සියයට 85 දක්වා ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුලදී උපයෝජනය කර නොතිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති /විධානයට යොමුව		නිරීක්ෂණය
(අ)	2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වගන්තිය	ඉකුත් වර්ෂයට අදාල තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු වාර්ෂික වාර්තාව 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 261(2)	වෙක්පත් මඟින් ගෙවීම් කිරීමේදී වෙක්පතේ අංකය වවුවරයේ මෙන්ම මුදල් පොතේ නියමිත සටහන ඉදිරියෙන් සටහන් කල යුතු වුවද ඉන් බැහැරව කටයුතු කළ අවස්ථා 26 ක් විගණනයේදී නිරීක්ෂණය විය.
	(ii) මුදල් රෙගුලාසි 262(2)	වවුවර්පතෙහි හෝ තහවුරු කරන ලියවිලිවල හෝ ඒ දෙකෙහිම "ගෙවන ලදී" යන මුද්‍රාව යොදා ගෙවූ දිනය මුද්‍රාවෙහි යෙදිය යුතු වුවද ඉන් බැහැරව කටයුතු කර තිබූ අවස්ථා 24 ක් නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.
(ඇ)	2023 නොවැම්බර් 30 දිනැති අංක 02/2018 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) 2025 ජනවාරි 01 දින වන විට පොලිස් කොමිෂන් සභාවේ අභියාචනා 549 ක් ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභියාචනා 523 ක්ද, විගණන සේවා කොමිෂන් සභාවේ අභියාචනා 02 ක්ද ලෙස වර්ෂය ආරම්භයේ අභියාචනා 1074 ක් ඉතිරිව තිබුණි. වර්ෂය තුළදී පිළිවෙලින් අභියාචනා 314, 356, 03 ක් ලෙස අභියාචනා 673 ක් ලැබී තිබූ අතර පිළිවෙලින් අභියාචනා 387, 449 හා 01 ක් ලෙස අභියාචනා 837 ක් අවසන් කර තිබුණි. ඒ අනුව වර්ෂය අවසානයේ අභියාචනා පිළිවෙලින් 476 ක්, 430 ක් හා 04 ක් ලෙස අභියාචනා 910 ක් ඉතිරිව පැවතුනි.

(ආ) වර්ෂය අවසානයේදී ඉතිරිව පැවති අභියාචනා 910 තුල අභියාචනා ලද දිනය අනුව සැලකීමේදී වර්ෂයක් තුල ලැබූ අභියාචනා 498 කින්ද, වර්ෂ 2-4 අතර කාලයකදී ලද අභියාචනා 297 කින් ද , වර්ෂ 5 හෝ ඊට වැඩි කාලයකදී ලද අභියාචනා 115 ක්ද විය.

(ඇ) අභියාචනා විභාග කිරීමේදී එක් එක් අභියාචනයන්ට අදාල කරුණු එයටම ආවේණික වන අතර, අභියාචනා අවසන් කිරීමේදී අභියාචනා සඳහා ඉඩදීම විවිධ කරුණු මත ප්‍රතික්ෂේප කිරීම මෙන්ම ඉදිරි කටයුතු සඳහා බහා තැබීමදව සිදු කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුළදී ජාතික පොලිස් කොමිසමේ අභියාචනා 387 ක්ද, රාජ්‍ය සේවා කොමිසමේ අභියාචනා 449 ක්ද, විගණන සේවා කොමිසමේ අභියාචනා 01 ක්ද ලෙස අභියාචනා 837 අවසන් කර තිබුණි.

4.2 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මාර්ගෝපදේශයේ සඳහන් ආකෘතියට අනුකූල වන ලෙස, වගකීමේ ක්ෂේත්‍ර, ක්‍රියාකාරකම්, ප්‍රතිපාදන (In put) හා ප්‍රතිඵලය (Outcome) ඇතුලත්කර 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

අධිකාරය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 32 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 23 ක් වීම හේතුවෙන් කාර්ය මණ්ඩලයේ තනතුරු 09 ක පුරප්පාඩු තවදුරටත් පැවතුණි.ලේකම්, සහකාර ලේකම්, ගණකාධිකාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු තුනම කොන්ත්‍රාත් පදනම මත 2017 වර්ෂයේ සිට වාර්ෂිකව අලුත් කරමින් පත්කර තිබුණි.

කේ.කේ.සුජාතාදේවි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට